# ශ්‍රී ලංකාවේ පුරාණ කාසි මඟින් හෙළිවන සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන තොරතුරු

කේ.ජී.සී.ඩී. කිරිඇල්ල[1], ජේ.කේ.එස්.එම්. පෙරේරා[2], ඩී.පී.අයි.එම්. කරුණාරත්න[3]

ඉතිහාසය අධ්‍යයන කිරීමේ වැදගත් මූලාශ්‍රයක් ලෙස නාණක මූලාශ්‍රය යොදා ගනු ලබන අතර එහිදී කාසි මගින් අර්ථික තොරතුරු මෙන්ම සමකාලීන සමාජයේ පැවති ආගමික, දේශපාලනික සාමාජීය සාධක රාශියක් අනාවරණය කරගත හැකිය. කාසියේ සංකේත පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කලාත්මක දෘෂ්ටිකෝණයක් මෙන්ම සමකාලීන තොරතුරු එහිලා ගැබ්ව තිබේ. ඒ අනුව ඇතා සහ ස්වස්ථික කාසි, ලක්ෂ්මී තහඩු කාසි, සිංහ කාසි යනා දී කාසි තුළට සංකේත එකතු වූයේ කුමන පදනමකින් ද යන්න විමර්ශනය කිරීමේ දී මූලාශ්‍රය අධ්‍යයනය මඟින් ප්‍රාථමික දත්ත හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් මෙන්ම කෞතුකාගාර අධ්‍යයන ඇසුරින් සිදු කරන ලද විමර්ශනයන්ගෙන් හෙළිදරව් වුයේ නාණක මූලාශ්‍රය තුළින් හුදෙක් ආර්ථිකමය තොරතුරු මෙන්ම සමකාලීන සමාජයේ අංශය ඒ තුළින් නිරූපනය වී තිබෙන බවය . මෙම කාසි තුළ ඇති ඇත්, වෘෂභ, මත්ස්‍ය, ඉර, හඳ සංකේතය මෙන්ම ස්වස්ථික සංකේතය කාසි තුළ අන්තර්ගත වී ඇත. එම සංකේත අතරින් ස්වස්ථිකය මඟින් ධර්ම චක්‍රය සංකේතවත් වේ. එකළ බුදු දහමට පැවති තත්ත්වය කෙබඳු දැයි මේ තුළින් ගම්‍යමාන වේ. ඇත් රූපය කාසියේ අන්තර්ගත වී තිබීම තුළින් ගම්‍ය වන්නේ පාලකයා සතු නීත්‍යානුකූල බලය උද්දීපනය කරනු වස් ඇතා වැනි ශ්‍රේෂ්ඨ සත්ත්වයෙකුගේ සංකේතය යොදන්නට ඇති බවය. සිංහ කාසියේ නිරූපණය වන සිංහ ලකුණ මඟින් සිංහල ජාතියේ සලකුණ සංකේතවත් කරයි. එය සිංහලයන්ගේ අයිතිය දනවනු වස් නිරූපනය කරන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. ඒ අනුව පුරාණ කාසිවලින් නිගමනය කළ හැකි වන්නේ කාසිය තුළ සැබවින්ම ආර්ථික තොරතුරු හෙළිදරව් කිරීමට යොදා ගන්නවා සේම, එය තුළින් සමකාලීන සමාජයේ සෑම අංශයක්ම නිරූපණය වන ලෙස නිර්මාණය කර තිබීම අනාවරණය කරගත හැකි බවය. ලංකාවේ කාසිවල සංකේත බොහෝමයක් ඉන්දියාවේ කාසි හා සමතාවයක් දක්නට ලැබීම ද මෙහිදී විශේෂයෙන් සැලකිය යුතුය. ඒ තුළින් දෙරට අතර පැවති ශිල්පීය දක්ෂතා මෙන්ම ප්‍රාථමික සංස්කෘතික ලක්ෂණ හඳුනාගත හැකිය. සමස්තයක් ලෙස නාණක මූලාශ්‍රය සලකා බැලීමේදී දේශපාලන ක්‍රමය ආර්ථික සමාජ ක්‍රමය මත හැඩ ගැසුණු චර්යා නීති යනාදී සමස්තය අධ්‍යයනය කිරීමට කාසිය තුළින් ඉඩ ප්‍රස්ථාව විවර වන බව නිගමනය කළ හැකිය .

ප්‍රමුඛ පද : නාණක මූලාශ්‍රය , සංකේත, ස්වස්ථික කාසි, කෞතුකාගාර

[1 2 3] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.kgchathuri22@gmail.com